විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions
පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය
எனது இல.
My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 03/2019

ඔබේ අංකය
உமது இல.
Your No. } ........................

දිනය
திகதி
Date } 2019.03.05

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත.

**<u>විශ්‍රාම වැටුප් සංශෝධනය කරනු ලබන අවස්ථාවේ දී පාරිතෝෂික ගෙවීම</u>**

විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් නැවත සේවයේ යෙදීමේදී මෙන්ම විශ්‍රාම ලැබීමෙන් පසු සිදුවන වැටුප් සංශෝධනයන් හා උසස් වීම් වලදී එම විශ්‍රාමිකයාට නිශ්චිත වූ දින වකවානුවලදී විශ්‍රාම වැටුප් සංශෝධනය වීම සිදුවේ. එලෙස විශ්‍රාම වැටුප් සංශෝධනයේ දී පාරිතෝෂික ගණනය කර ගෙවීම් කිරීම සම්බන්ධයෙන් විවිධ ගැටළු හා පරස්පරතාවයන් මතුවී ඇති බව වාර්තා වේ. එම තත්ත්වය නිවැරදි කර ගැනීම සඳහා පහත සඳහන් උපදෙස් දැඩිව පිළිපදින ලෙස දන්වා සිටිමි.

1. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට අනුව රජයේ නිලධාරීන්ට විශ්‍රාම යාමේදී හිමි පාරිතෝෂිකය ගණනය කරනු ලබන්නේ ඔහු හෝ ඇය රාජ්‍ය සේවයේ යෙදී සිටිය දී අවසන් වරට ලබාගත් විශ්‍රාම වැටුපට ගණනය කරනු ලබන වැටුප් හා දීමනා පදනම් කරගෙන වේ. එබැවින් කල්පිත වැටුපේ පිහිටුවා හිඟ වැටුප් රහිතව වැටුප් සංශෝධනයෙන් ලබාදෙනු ලබන කිසිදු විශ්‍රාමිකයෙකුට විශ්‍රාම පාරිතෝෂිකයක් නොගෙවිය යුතු වේ. විශ්‍රාම වැටුප පමණක් සංශෝධනය කර අදාළ අනුමත දින සිට ගෙවීමට පියවර ගත යුතුයි.

2. විශ්‍රාම වැටුප් සංශෝධනයේ දී අඩුකල හා අඩුනොකල විශ්‍රාම වැටුපේ පිහිටුවීමේ දී,

    2.1. විශ්‍රාම පාරිතෝෂිකය ලබාගැනීම හේතුවෙන් අඩුකල විශ්‍රාම වැටුප් ලබාගන්නා කාල පරිච්ඡේදය තුළ විශ්‍රාම වැටුප් සංශෝධනය වන්නේ නම් එම අඩුකල විශ්‍රාම වැටුප් මත වසර 10 කදී අයවිය යුතු පාරිතෝෂිකය ගණනය කර එමගින් දැනට අයවී ඇති මුදල අඩුකර ඉතිරිය වාරික වශයෙන් වසර 10 ට අයත් ඉතිරි කාලය තුල අයවී යන පරිදි සකසා අඩුනොකල වැටුපේ පිහිටුවීමට කටයුතු කළ යුතුය. මෙය ප්‍රදාන පත්‍රයේ සඳහන් කිරීමට ක්‍රියාකල යුතුයි. විශ්‍රාමිකයාගේ ගොනුවට ද එය ඇතුලත්ව තිබිය යුතුයි.

    2.2. නැවත සේවයේ යෙදීමක දී නම් 2012 මාර්තු මස 19 වැනි දින හෝ ඉන්පසු 2018. 08.16 දින දක්වා විශ්‍රාමිකයින් සඳහා 2018 අගෝස්තු 16 දිනැති ගැසට් නිවේදනයේ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

2.3. නැවත සේවයේ යෙදීමේ දී 2012 මාර්තු මස 19 දිනට පෙර විශ්‍රාමිකයෙකු සඳහා නම් නව පාරිතෝෂිකයත් පෙර පාරිතෝෂිකයත් අතර වෙනස සහ අඩුකළ විශ්‍රාම වැටුප මත පදනම්ව නැවත සේවයෙන් විශ්‍රාම ලැබූ දින දක්වා අයකළ මුදල යන අගයන් දෙක එකතු කර ගෙවීමට පියවර ගත යුතුය. මෙම ක්‍රමය වලංගු වන්නේ නව ඉල්ලීම් සඳහා පමණක් වන අතර නැවත සේවයේ යෙදීමේ දී දැනටමත් ඉහත 2.2 පරිදි අයකල 2012 මාර්තු 19 දිනට පෙර විශ්‍රාමිකයින් සඳහා දැනට හඳුන්වා දී ඇති මාර්ගගත පද්ධතිය පමණක් භාවිතා කල යුතුයි.

2.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2018 අනුව 2018.02.01 දිනට පසුව නැවත රජයේ සේවයට වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් පසුව එක්වන විශ්‍රාමිකයන් සඳහා කිසිඳු ආකාරයකින් විශ්‍රාම වැටුප සංශෝධනය නොකළ යුතුය.



ඒ ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්